කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2015

(නව නිර්දේශය)

2021 මාර්තු - 2022 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

සිංහල

සිංහල භාෂා සම්ප්‍රදාය හා කලා ශිල්ප SINH E – 2025

සැම කොටසකින්ම අයත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

I කොටස

01. 'සිංහලය ආර්‍ය මූල භාෂාවක් මිස අනාර්‍ය මූල භාෂාවක් නොවේ.' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

නැතහොත්

'භාෂාවක් කිනම් භාෂා පවුලකට අයත් වේදැ'යි නිශ්චය කිරීම අපහසු ය.' සිංහල භාෂාව සම්බන්ධයෙන් මෙම ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව පිරික්සන්න.

02. සිංහල ප්‍රාකෘත යුගයේ භාවිත අක්ෂර මාලාව පිළිබඳ සාවධාන වෙමින් තත් යුගයේ භාෂා ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න.

03. මධ්‍යතන සිංහල යුගය සිංහල භාෂා පරිණාමයෙහි සංක්‍රාන්ති අවධියක් ලෙස කොතෙක් දුරට සැලකිය හැකිදැ'යි පිරික්සන්න.

II කොටස

04. 'සකුසත් අනුසරෙන් - ඇත ද සදනට ලිඟු බේ<br>නොපෙනේ වහර වෙසෙසක් - පුම ඉතිරි ලිඟු දෙක විනා'

යථෝක්ත ගීය නිශ්‍රය කරගනිමින් සිදත් සඟරාවේ ලිංග වර්ගීකරණය පිළිබඳ විග්‍රහයක් කරන්න.

05. ස්වාභාවික සන්ධි හා කෘත්‍රිම සන්ධි වෙන් වශයෙන් හඳුන්වා සිදත් සඟරාවේ සන්ධි විග්‍රහය පිළිබඳ විමසීමක් කරන්න.

06. 'අර්ථ සම්පන්න වාක්‍යයක මූලික පදනම ක්‍රියා කාරක පද සම්බන්ධයයි.' ෂට් කාරක පිළිබඳ අවධානය යොමුකරමින් පූර්වෝක්ත ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව පහදන්න.

07. අනාගත කාලික ක්‍රියා රූප පිළිබඳ සිදත් සඟරාවේ ඉගැන්වීම් විමර්ශනයට ලක් කරන්න.

## III කොටස

08. 'මහින්දාගමනය ලාංකේය ශිල්ප කලාවන්හි ප්‍රාරම්භක අවස්ථාවයි.' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

09. බුදු පිළිමයේ සමාරම්භය පිළිබඳ මතවාදයන් හෙළිකොට ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාව පිළිබඳ විමසීමක් කරන්න.

10. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් හතරක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i . සීගිරි චිත්‍ර කලාව
ii . වාහල්කඩ
iii. සඳකඩපහණ
iv. පොළොන්නරු ගල්විහාරය
v . අවලෝකිතේශ්වර බෝධි සත්ත්ව ප්‍රතිමා
vi. ඉසුරුමුණියේ ගල්කැටයම්

(එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින්)

********************************************